# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2110/41 - 2019 පෙබරවාරි මස 14 වැනි බ්‍රහස්පතින්දා - 2019.02.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### බස්නාහිර පළාතේ පළාත් සභාව

2018 අංක ........ දරන බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතන සම්පත් මධ්‍යස්ථාන ප්‍රඥප්තිය

2018 අංක ......... දරන බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතන සම්පත් මධ්‍යස්ථාන ප්‍රඥප්ති කෙටුම්පත සඳහා බස්නාහිර පළාතේ අමාත්‍ය මණ්ඩල අනුමැතිය, අමාත්‍ය මණ්ඩල තීරණ අංක. VI/107/01-2018-02 (iii) හා 2018.01.24 දිනැතිව ලැබී ඇති බවත් එය බස්නාහිර පළාත් සභාවේ අනුමැතිය සඳහා මවිසින් යෝජනා කරන්නට නියමිත බවත් මහජනයාගේ දැන ගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

ඉසුර දේවප්‍රිය,
ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන, ආර්ථික ප්‍රවර්ධන,
විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජල සම්පාදන හා
ජලාපවහන සහ සංචාරක කටයුතු අමාත්‍යාංශය.
බස්නාහිර පළාත.

2019 ජනවාරි මස 30 වැනි දින දීය.

**2018 අංක ............ දරන බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතන සම්පත් මධ්‍යස්ථාන ප්‍රඥප්තිය**

බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතනයන්හි ධූරධාරීන් සහ කාර්ය මණ්ඩල සඳහා පුහුණු අවශ්‍යතා හඳුනාගනිමින් පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා ත්, පළාත් පාලන ආයතනයන්හි මහජන සේවාවන් වඩාත් කාර්යක්ෂම කරනු පිණිස තොරතුරු තාක්ෂණය භාවිතය පිළිබඳ දැනුම පළාත් පාලන ආයතනයන්හි ව්‍යාප්ත කිරීමටත්, ඒ සඳහා බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතන සම්පත් මධ්‍යස්ථානය නම් ආයතනයක් පිහිටු වීම සඳහාත්, ඊට අනුශාංගික සියළු කරුණු සඳහා විධිවිධාන සැලසීම පිණිසද වූ ප්‍රඥප්තියකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ බස්නාහිර පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

01. මෙම ප්‍රඥප්තිය බස්නාහිර පළාතේ පළාත් සභාවේ 2018 අංක ........... දරන ''පළාත් පාලන ආයතන සම්පත් මධ්‍යස්ථාන ප්‍රඥප්තිය'' වශයෙන් හඳුන්වනු ලබන අතර, ආණ්ඩුකාරවරයාගේ අනුමතය ලද දින සිට ක්‍රියාත්මක වන්නේ ය. *(ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වන දිනය)*



*මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## *I* කොටස

### බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතන සම්පත් මධ්‍යස්ථානය පිහිටුවීම

පිහිටුවීම.

2. මෙහි මින්මතු ''මධ්‍යස්ථානය'' යනුවෙන් හඳුන්වනු ලබන බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතන සම්පත් මධ්‍යස්ථානය මෙයින් පිහිටුවනු ලැබේ.

3. මධ්‍යස්ථානය දෙවන වගන්තිය යටතේ ඊට දී ඇති නාමයෙන් සංස්ථාවක් විය යුතු අතර ඊට අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් තිබිය යුතු ය. තවද ඒ නාමයෙන් මධ්‍යස්ථානය විසින් නඩු පැවරීම සහ මධ්‍යස්ථානය නමින් ඊට විරුද්ධව නඩු පවරනු ලැබීමද කරනු ලැබිය හැකි ය.

මධ්‍යස්ථානයේ මුද්‍රාව

4. (1) මධ්‍යස්ථානය සතු මුද්‍රාව සභාපතිවරයා භාරයේ තිබිය යුතු ය.

(2) මධ්‍යස්ථානය මුද්‍රාව මධ්‍යස්ථානය විසින් තීරණය කරනු ලබන ආකාරයකට විය යුතු ය.

(3) සභාපතිවරයා හා අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයකු ඉදිරිපිටදී හැර කිසිම සාධන පත්‍රයකට, ලියවිල්ලකට හෝ ගිවිස්නාවකට මධ්‍යස්ථානයේ මුද්‍රාව නොතැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට සාක්ෂි වශයෙන් ඒ දෙදෙනා විසින් ඒ සාධන පත්‍රයට, ලේඛනයට හෝ ගිවිස්නාවකට තම අත්සන තැබිය යුතු ය.

(4) මධ්‍යස්ථානයේ මුද්‍රාව තබන ලේඛණ හා ලියකියවිලි පිළිබඳව ලේඛණයක් මධ්‍යස්ථානය විසින් පවත්වාගෙන යා යුතු ය.

## *II* කොටස

### මධ්‍යස්ථානයේ අරමුණු

අරමුණු

5. මධ්‍යස්ථානයේ අරමුණු පහත සඳහන් පරිදි විය යුතු ය.

(1) බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතන වෙත තේරී පත්වන ධූරධාරීන් සඳහා මෙන්ම බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතනයන්හි සේවයේ නියුතු කාර්යමණ්ඩල සඳහා පුහුණු අවශ්‍යතා හඳුනා ගැනීම හා එසේ හඳුනාගැනීම සඳහා අවශ්‍ය කරන සමීක්ෂණ කටයුතු සිදු කිරීම හා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.

(2) බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතනයන්හි මහජන සේවාවන් වඩාත් කාර්යක්ෂම අයුරින් පවත්වාගෙන යාම සඳහා නවීන තාක්ෂණික ක්‍රමෝපායන් මෙන්ම තොරතුරු තාක්ෂණය භාවිතය සම්බන්ධයෙන් පළාත් පාලන ආයතන ධූරධාරීන් හා කාර්යමණ්ඩල දැනුවත් කිරීම.

(3) බස්නාහිර පළාත තුළ පළාත් පාලන ආයතන අරමුණු කරගත් පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම උදෙසා පුහුණු ශ්‍රවනාගාර, සම්පත් මධ්‍යස්ථාන පර්යේෂණ මධ්‍යස්ථාන, විද්‍යාගාර හා නේවාසික කඳවුරු පවත්වාගෙන යාම.

(4) පළාත් පාලන ආයතන බලතල කාර්යකර්තව්‍ය සම්බන්ධයෙන් සමාජ දැනුවත් කිරීම් උදෙසා වන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

මධ්‍යස්ථානයේ සංයුතිය

6. මධ්‍යස්ථානය පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය.

(1) නිල බලයෙන් පත්වන සාමාජිකයින් ; එනම්,

(අ) බස්නාහිර පළාතේ පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්
(ආ) බස්නාහිර පළාතේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු)
(ඇ) බස්නාහිර පළාතේ පළාත් පාලන කොමසාරිස් සහ

(2) පත් කළ සාමාජිකයන් ; එනම්

සාමාජිකයන්ගේ ධූර කාලය

බස්නාහිර පළාතේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන බස්නාහිර පළාතේ මහ නගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා නියෝජනය කරමින් නගරාධිපතිවරයෙකු, සභාපතිවරයෙකු ද නාගරික කොමසාරිස්වරයෙකු ද නගර සභා හෝ ප්‍රාදේශීය සභා ලේකම්වරයෙකු ද

මධ්‍යස්ථානයේ සභාපතිවරයා

(3) ඉහත උපවගන්තිය යටතේ නිලබලයෙන් පත්වන සාමාජිකයන් අතරින් බස්නාහිර පළාතේ පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් මධ්‍යස්ථානයේ සභාපතිවරයා විය යුතු ය.

(4) මධ්‍යස්ථානයේ සෑම සාමාජිකයෙකුටම අමාත්‍යවරයා විසින් කලින් කළ තීරණය කරනු ලබන ආකාරයට පාරිශ්‍රමික මධ්‍යස්ථානය විසින් ගෙවනු ලැබිය හැකි ය.

මධ්‍යස්ථානයේ තීරණ

7. (1) මධ්‍යස්ථානය විසින් තීරණය කරනු ලැබිය යුතු යැයි මෙම ප්‍රඥප්තියෙන් බලය දී ඇති සියළු කාරණා සහ ප්‍රශ්න මෙම ප්‍රඥප්තියේ විධිවිධානවලට හා ඒ යටතේ සාදන ලද රීතිවලට අනුකූලව පවත්වනු ලබන මධ්‍යස්ථානයෙහි රැස්වීමකට පැමිණ සිටින සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් තීරණය කරනු ලැබිය යුතු ය.

(2) යම් රැස්වීමකට පැමිණ සිටින සාමාජිකයන්ගේ ඡන්දය, යම් ප්‍රශ්නයක් සම්බන්ධයෙන් සම ලෙස බෙදී තිබෙන අවස්ථාවක, එම රැස්වීමේ මූලාසනය දරන මධ්‍යස්ථානයෙහි සභාපති හෝ වෙනත් සාමාජිකයෙකුට තමාට ඇති ඡන්දයට අමතරව තීරක ඡන්දයක් ඇත්තේ ය.

(3) මධ්‍යස්ථානයෙහි යම් රැස්වීමක් සඳහා වූ ගණපූරණය සාමාජිකයන් තිදෙනෙකු විය යුතු ය.

(4) මධ්‍යස්ථානයේ සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් තිබියදී වුවද, මධ්‍යස්ථානයට ක්‍රියා කළ හැකිය. මධ්‍යස්ථානයේ සාමජිකයන් අතර යම් පුරප්පාඩුවක් තිබීම හෝ එහි සාමාජිකයෙකු පත්කිරීමෙහි හෝ නම් කිරීමෙහිලා හෝ යම් දෝෂයක් තිබීම පමණක් හේතුකොට ගෙන මධ්‍යස්ථානයෙහි යම් ක්‍රියාවක් හෝ කටයුත්තක් අවලංගු වීම හෝ අවලංගු වූ සේ සලකනු ලැබීම සිදු නොවිය යුතු ය.

(5) මෙම ප්‍රඥප්තියෙහි 16 වන වගන්තිය යටතේ පත්කරනු ලබන අධ්‍යක්ෂක, මධ්‍යස්ථානයෙහි ලේකම්වරයා වශයෙන් කටයුතු කළ යුතු ය.

(6) මධ්‍යස්ථානයෙහි රැස්වීම්වලට පැමිණ සිටීමේ සහ ඒ රැස්වීම්වල අදහස් දැක්වීමේ හිමිකම මධ්‍යස්ථානයෙහි ලේකම්වරයාට ඇත්තේ වුවද මධ්‍යස්ථානයේ රැස්වීම් වල ඡන්දය දීමේ හිමිකමක් නොමැත.

බලතල හා කර්තව්‍ය

8. මධ්‍යස්ථානයේ බලතල හා කර්තව්‍ය පහත සඳහන් පරිදි විය යුතු ය.

(1) බස්නාහිර පළාතේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ කාර්යමණ්ඩල සඳහා ද, බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතන වල ධූරධාරීන් හා කාර්යමණ්ඩල සඳහා ද, බස්නාහිර පළාතේ පළාත් පාලනය අනුබද්ධ කාර්යමණ්ඩල සඳහා ද දැනුම කුසලතා හා ආකල්ප සංවර්ධනය සඳහා අවශ්‍ය පුහුණු වැඩසටහන් සැලසුම් කිරීම ක්‍රියාත්මක කිරීම ;

(2) බස්නාහිර පළාතේ පළාත් පාලන දෙපාර්තමේන්තුවට හා පළාත් පාලන ආයතන වලට අනුබද්ධිත කාර්යමණ්ඩල සඳහා පළාත් පාලනයට අදාළ වන පරිදි පුහුණු සහතික පත්‍ර පාඨමාලා පැවැත්වීම ;

(3) මධ්‍යස්ථානය නමින් වෙනම අරමුදලක් පවත්වා ගෙන යාම ;

(4) පළාත් පාලන ආයතනයන්හි කාර්යක්ෂමතාවය සහ ඵලදායිතාය වර්ධනය කිරීම සඳහා ද පළාත් පාලන කටයුතු නියාමනය කිරීම සඳහා ද හේතුවන පරිදි පළාත් පාලන ආයතන, තොරතුරු තාක්ෂණය භාවිතය සඳහා යොමු කිරීම හා ඊට අදාළ උපදේශන සිදු කිරීම.

(5) මධ්‍යස්ථානය පවත්වාගෙන යනු ලබන පුහුණු වැඩසටහන් මගින් දැනුම සංවර්ධනය කිරීමෙහි ලා විශේෂඥ දැනුම ඇති වෘතිකයන්ගේ සේවාව ලබා ගැනීම හා ඊට අදාළ වෘත්තිමය ගෙවීම සිදු කිරීම.

(6) ශ්‍රී ලංකාව තුළ රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන සිවිල් සංවිධාන මගින්, මධ්‍යස්ථානය නමින් මධ්‍යස්ථානයේ අරමුණ සඳහා හේතු වන පරිදි දෙනු ලබන කවර හෝ පරිත්‍යාග භාර ගැනීම දැරීම එසේ වූ මූල්‍ය පරිත්‍යාග අවශ්‍යතාවය පරිදි මධ්‍යස්ථානයේ අරමුදලේ වූ වෙන් වෙන් වූ ගිණුම් යටතේ පවත්වාගෙන යාම.

(7) මධ්‍යස්ථානය විසින් සපයන සේවා සඳහා ගාස්තු නියම කිරීම හා අය කිරීම.

(8) මධ්‍යස්ථානයේ අරමුණු යටතේ ක්‍රියාකිරීම සඳහා වෙනත් පාර්ශවයන් සමග ගිවිස ගැනීම.

(9) පළාත් පාලන ආයතන කාර්යමණ්ඩල දැනුම සංවර්ධනය සඳහා අවශ්‍ය පොත්පත් සඟරා ලේඛන ප්‍රකාශයට පත් කිරීම ද ඇතුළුව මධ්‍යස්ථානය තීරණය කරන ප්‍රමාණයට අවශ්‍ය තාක්ෂණික සහාය ලබා දීම.

(10) මධ්‍යස්ථානය අවශ්‍ය යැයි තීරණය කරනු ලබන සියළුම තනතුරු ඊට අදාළ විධිමත් පටිපාටීන්ට අනුව ඇති කිරීම.

එසේ වුවද මධ්‍යස්ථානයේ ආරම්භක අවස්ථාවේ මධ්‍යස්ථානයේ කාර්යමණ්ඩලය අවස්ථාවෝචිත පරිදි බස්නාහිර පළාතේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ අනුමත කාර්යමණ්ඩලය තුළින් ක්‍රියාත්මක විය යුතු ය.

(11) මෙම ප්‍රඥප්තිය යටතේ සඳහන් අරමුණු සාක්සාත් කර ගැනීමට අවශ්‍ය යයි හෝ හේතු වේ යැයි මධ්‍යස්ථානය තීරණය කරනු ලබන ක්‍රියාමාර්ගයන්හි නිරත වීම.

(12) යම් නිශ්චල හෝ චංචල දේපළක් අත්කර ගැනීම, මිලට ගැනීම, දැරීම, බද්දට හෝ කුලියට දීම, උකස් කිරීම, විකිණීම හෝ අන්‍යාකාරයෙන් බැහැර කිරීම.

(13) මධ්‍යස්ථානයේ කාර්යමණ්ඩලය තනතුරුවලට පත්කිරීමට ඉවත් කිරීමට අදාළ කාර්ය පරිපාටි සකස් කිරීම හා නියම කිරීම.

(14) මධ්‍යස්ථානය විසින් සේවාවන් ලබා ගන්නා වූ සම්පත් දායකයින් සඳහා දීමනා තීරණය කිරීම හා ගෙවීම.

(15) මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂවරයා ඇතුළු මධ්‍යස්ථාන කාර්යය මණ්ඩලය සඳහා පාරිශ්‍රමික ගෙවීම, එසේ ගෙවනු ලබන පාරිශ්‍රමික ඔහු දරන නිත්‍ය තනතුරේ වැටුපෙන් 1/4 ක වැටුප් ප්‍රමාණයක් විය යුතු ය.

අමාත්‍යවරයා මධ්‍යස්ථානයට විධාන දිය හැකි බව

9. මධ්‍යස්ථානය විසින් මේ ප්‍රඥප්තිය යටතේ බලතල ක්‍රියාත්මක කිරීමේ දී කාර්ය කර්තව්‍ය ඉටුකිරීමෙහිලා අමාත්‍යවරයා විසින් මධ්‍යස්ථානය වෙත සාමාන්‍ය වශයෙන් හෝ විශේෂ වශයෙන් විධාන නිකුත් කළ හැකි අතර මධ්‍යස්ථානය, එකී විධානවලට යටත්ව කටයුතු කළ යුතු ය.

10. මෙම ප්‍රඥප්තියේ බලතල හා කාර්ය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් උපදෙස් දීම සඳහා උපදේශක මණ්ඩලයක්, මෙම ප්‍රඥප්තිය යටතේ සාදනු ලබන රීති මගින් නියම කරනු ලබන ආකාරයට පත් කළ හැකි ය.

## *III* වන කොටස

### මධ්‍යස්ථානයේ අරමුදල්

මධ්‍යස්ථානයේ අරමුදල්

11. (1) මධ්‍යස්ථානයට මධ්‍යස්ථානයේ නමින් අරමුදලක් විය යුතු ය.

(2) මධ්‍යස්ථානයෙහි අරමුදලට ;.

(අ) මධ්‍යස්ථනය සඳහා පළාත් සභාව විසින් කලින් කල සම්මත කරනු ලබන සියළුම මුදල්,

(ආ) මධ්‍යස්ථානයෙහි අරමුණු ක්‍රියාත්මක කිරීමෙහි ලා හා බලතල කර්තව්‍ය ඉටුකිරීමෙහි ලා මධ්‍යස්ථානය නමින් උපචිත සියළු මුදල් හා මධ්‍යස්ථානයේ සේවා සැපයීමේ ලා අයවිය යුතු සියළුම මුදල්

(ඇ) මධ්‍යස්ථානයෙහි බලතල ක්‍රියාත්මක කිරීමෙහි ලා කාර්ය ඉටුකිරීමෙහි ලා මධ්‍යස්ථානය නමින් පිරිනැමෙන මූල්‍ය පරිත්‍යාග.

(ඈ) මධ්‍යස්ථානයේ සේවා අපේක්ෂාවෙන් බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතන විසින් වාර්ෂික අයවැය ලේඛනය මගින් වෙන් කරනු ලබන දායක මුදල්.

ලැබිය යුතු ය.

(3) මධ්‍යස්ථානයේ අරමුදලට ලැබී ඇති, මධ්‍යස්ථානයෙහි අරමුදලින් ගෙවනු ලැබිය යුතු සියළුම මුදල් රජයේ බැංකුවක තැන්පත් කරනු ලැබිය යුතු ය.

12. මධ්‍යස්ථානයේ අරමුදලින්

(1) මධ්‍යස්ථානයේ කටයුතු කළමනාකරණය කිරීමේදී ද, මධ්‍යස්ථානයේ සාමාජිකයන්ට සහ මධ්‍යස්ථානයේ සේවා නියුක්තිකයන්ට පාරිශ්‍රමික ගෙවීමේදී ද මේ ප්‍රඥප්තිය යටතේ මධ්‍යස්ථානයේ බලතල සහ කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේදී ද, ඉටුකිරීමේදී ද මධ්‍යස්ථානය විසින් කලින් කළ බලය දෙනු ලබන වෙනත් යම් කාර්ය සඳහා ද මධ්‍යස්ථානයේ අරමුදල් මධ්‍යස්ථානය විසින් ගෙවනු ලැබිය හැකි ය. වියදම්

(2) මධ්‍යස්ථානයෙහි අරමුදලින් කරනු ලබන සියළු ගෙවීම් සඳහා වූ චෙක්පත් හෝ අණකර මධ්‍යස්ථානය විසින් ඒ සඳහා බලය පවරනු ලැබූ දෙදෙනෙකු විසින් අත්සන් කරනු ලැබිය යුතු ය.

13. (1) මධ්‍යස්ථානයෙහි මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) මධ්‍යස්ථානයෙහි සභාපතිවරයා විසින් එක් එක් වර්ෂයකදී, මෙම ප්‍රඥප්තිය යටතේ රීති මගින් නියම කරනු ලැබ ඇති දිනයකදී හෝ ඊට පෙර සහ රීතිවල දක්වා ඇති ආකෘතිය අනුව, එළඹෙන මුදල් වර්ෂය සඳහා ඇස්තමේන්තුවක් එම වර්ෂයේ දී ලබා ගත හැකි ආදායම් හා යෝජිත වියදම පිළිබඳ විස්තර ඇතුළත්ව පිළියල කොට, මධ්‍යස්ථානය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. අයවැය ලේඛනය

(3) එම ඇස්තමේන්තුව අදාළ වන වර්ෂය ආරම්භ වීමට පෙර මධ්‍යස්ථානය විසින්ම එහි යම් සංශෝධන කිසිවක් තිබේනම්, ඒවා ද සමග අවසාන වශයෙන් සැළකිල්ලට භාජනය කොට සම්මත කරනු ලැබිය යුතු ය.

(4) මධ්‍යස්ථානයේ සභාපතිවරයා විසින් අවශ්‍ය නම් කවර හෝ අවස්ථාවකදී අතිරේක ඇස්තමේන්තුවක් පිළියෙල කොට මධ්‍යස්ථානයට ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(5) යම් ඇස්තමේන්තුවක හෝ අතිරේක ඇස්තමේන්තුවක අඩංගු සියළු විෂයයන් නැතහොත් ඉන් කිසිවක් සම්මත කිරීම, වෙනස් කිරීම හෝ ප්‍රතික්ෂේප කිරීම නැතහොත් යම් විෂයක් එකතු කිරීම මධ්‍යස්ථානය විසින් කරනු ලැබිය හැකි ය.

14. (1) මධ්‍යස්ථානයෙහි ආදායම් වියදම්, වත්කම් බැරකම් සහ වෙනත් සියළු ගනුදෙනු පිළිබඳව මෙම ප්‍රඥප්තිය යටතේ පනවන රීති මගින් නියම කරනු ලබන ආකාරය නිසි පරිදි ගිණුම් තබා ගැනීමට සැලැස්විය යුතු ය. මධ්‍යස්ථානයේ ගිණුම්

(2) සෑම මුදල් වර්ෂයක් සම්බන්ධයෙන් ආදායම්, වියදම් ගිණුම් හා ශේෂ පත්‍රය අනුගාමී වර්ෂයේ මාර්තු 31 දිනයට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු ය.

15. මධ්‍යස්ථානයෙහි ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන අදාළ විය යුතු ය. ගිණුම් විගණනය

## *IV* වන කොටස

### මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලය

16. (1) බස්නාහිර පළාතේ පළාත් සභා රාජ්‍ය සේවයේ මාණ්ඩලික තනතුරක් දරමින් බස්නාහිර පළාතේ පළාත් පාලන අමාත්‍යාංශයේ හෝ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ තනතුරක සේවයේ නියුතු අයෙකු මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂක වශයෙන් බස්නාහිර පළාතේ පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් විසින් ද්වීතීය පදනමින් පත්කළ යුතු ය. මධ්‍යස්ථානයේ ප්‍රධාන පරිපාලන නිලධාරී පත් කිරීම.

(2) මධ්‍යස්ථානයෙහි කටයුතු මෙහෙයවීම, මධ්‍යස්ථානයේ බලතල කර්තව්‍ය හා කාර්ය සංවිධානය කිරීම සහ ක්‍රියාත්මක කිරීමද, මධ්‍යස්ථානයේ සේවා නියුක්තිකයන්ගේ පරිපාලනය, පාලනය, සභාපතිවරයාගේ සාමාන්‍ය විධානයට හා පාලනයට යටත්ව අධ්‍යක්ෂ වෙත භාරවිය යුතු ය. මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලයට බස්නාහිර පළාත්

(3) කාර්යක්ෂම ලෙස මධ්‍යස්ථානයේ බලතල ක්‍රියාත්මක කිරීම, කර්තව්‍ය සහ කාර්ය ඉටු කිරීම සඳහා අවශ්‍ය යැයි මධ්‍යස්ථානය සලකන නිලධාරීන් හෝ සේවකයන් මෙම ප්‍රඥප්තියේ විධිවිධාන අනුව මධ්‍යස්ථානය විසින් පනවන ලද කාර්ය පරිපාටීන්ට අනුකුලව පත්කිරීම සහ එකී තනතුරෙන් හෝ නිලයෙන් ඉවත් කිරීම බස්නාහිර පළාතේ පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් විසින් සිදු කළ හැකි ය.

රාජ්‍ය සේවයේ නිලධරයන් පත් කිරීම

17. (1) බස්නාහිර පළාත් සභා රජයේ සේවයේ නියුක්ත යම් නිලධරයකු, මධ්‍යස්ථානයේ ඉල්ලීම පිට ඒ නිලධරයාගේ සහ බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සහ අදාළ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ කැමැත්ත ඇතිව මධ්‍යස්ථානය විසින් එවැනිම කැමැත්ත ඇතිව නිශ්චය කරනු ලබන කාලසීමාවක් සඳහා මධ්‍යස්ථානයේ කාර්යය සඳහා මධ්‍යස්ථානයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය.

(2) නිශ්චිත කාලසීමාවක් ආණ්ඩුවට හෝ බස්නාහිර පළාත් සභාවට සේවය කිරීමට එකඟ වී ආණ්ඩුව සමග ගිවිසුමකට ඇතුළත් වී ඇති යම් තැනැත්තකු මධ්‍යස්ථානයට සේවය කරනු ලබන යම් කාලසීමාවක් ඒ ගිවිසුමේ බැඳීම් ඉටු කිරීමේ කාර්යය සඳහා ආණ්ඩුවට හෝ පළාත් සභාවට කරනු ලබන සේවයක් ලෙස සළකනු ලැබිය යුතු ය.

## *IV* වන කොටස

### පොදු කරුණු

මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට පළාත් සභා රජයේ නිළධරයන්

18. (1) මෙම ප්‍රඥප්තියේ අරමුණු වෙනුවෙන් ක්‍රියාත්මක වීම සඳහාත් බලතල ක්‍රියාත්මක කිරීම සඳහාත් රීති සෑදිය යුතු යැයි මෙම ප්‍රඥප්තියෙන් නියම කර ඇති සියළුම කරුණු ක්‍රියාත්මක කිරීම සඳහාත් අමාත්‍යවරයා විසින් රීති සෑදිය හැකි ය.

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම රීතියක්ම *ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබිය යුතු අතර එය පළවූ දිනයේ සිට හෝ *ගැසට් පත්‍රයේ* සඳහන් ඉදිරි දිනක සිට ක්‍රියාත්මක විය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම රීති *ගැසට් පත්‍රයේ* පළ වීමෙන් පසු හැකිතාක් ඉක්මණින් අනුමැතිය සඳහා පළාත් සභාව වෙත ඉදිරිපත් කළ යුතු ය. පළාත් සභාව එකී රීති අනුමත කර එකී අනුමැතිය පිළිබඳව *ගැසට් පත්‍රයක්* මගින් නිවේදනය කළ යුතු ය.

ඒ අයුරින් අනුමත කරනු නොලැබුවහොත් ඒබවද *ගැසට් පත්‍රයක්* මගින් නිවේදනය කළ යුතු අතර එදින සිට එම රීති යටතේ එතෙක් ගන්නා ලද ක්‍රියාමාර්ගයන්ට අගතියකින් තොරව පරිච්ඡින්න වූවා සේ සැලකිය යුතු ය.

නිශ්චල දේපළ අත්කර ගැනීමේ බලය

19. (1) මේ ප්‍රඥප්තියේ අරමුණ සඳහා පළාත තුළ පිහිටි යම් නිශ්චල දේපළක් අත්කර ගැනීම අවශ්‍ය බව මධ්‍යස්ථානය තීරණය කරන විටදී අත්පත් කර ගැනීමට අපේක්ෂිත දේපළ,

(අ) රජයේ දේපළක් වන විට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ 9 වන උපලේඛණයේ I වන ලැයිස්තුවේ පරිශිෂ්ඨ II හි 1 : 2 ඡේදය යටතේ වූ විධිවිධාන අනුව එකී දේපළ මධ්‍යස්ථානය වෙත ලබාදෙන ලෙස ද

(ආ) පෞද්ගලික දේපළක් වන විට ඉඩම් අත්පත් කර ගැනීමේ පනත යටතේ අත්පත් කර දෙන ලෙස ද පළාත් අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ පළාත් අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කර ඇති විටදී ඊට අදාළ ඉල්ලීම බස්නාහිර පළාතේ පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් විසින් ප්‍රධාන ලේකම් මගින් රජයේ ඉඩම් විෂය භාර අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ යුතු ය,

(3) (2) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද ඉල්ලීමකට අනුව, යම් දේපළක් මධ්‍යස්ථානයට පවරා ගැනීම සම්බන්ධයෙන් ගෙවිය යුතු යම් මුදලක් මධ්‍යස්ථානයේ අරමුදලින් ගෙවිය යුතු ය.

මධ්‍යස්ථානයේ සාමාජිකයන් සේවා නියුක්තිකයන් රජයේ සේවකයන් බව.

20. (1) මධ්‍යස්ථානයේ යම් සාමාජිකයෙකු හෝ මධ්‍යස්ථානයේ යම් සේවා නියුක්තිකයෙකු දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව රජයේ සේවකයෙකු වශයෙන් සලකනු ලැබිය යුතු ය.

(2) මධ්‍යස්ථානයේ අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් වශයෙන් සලකනු ලැබිය යුතු ය.

21. (1) මෙම ප්‍රඥප්තිය යටතේ මධ්‍යස්ථානය විසින් සද්භාවයෙන් කරනු ලබන හෝ කරන ලද්දේ යැයි උද්දේශිත යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් මධ්‍යස්ථානයට විරුද්ධවද, ප්‍රඥප්තිය යටතේ කරන ලද ක්‍රියා සඳහා ආරක්ෂාව

(2) මෙම ප්‍රඥප්තිය යටතේ හෝ මධ්‍යස්ථානයේ තීරණය පරිදි මධ්‍යස්ථානයේ නිලධාරියෙකු, සේවකයෙකු හෝ නියෝජිතයෙකු විසින් සද්භාවයෙන් කරනු ලබන හෝ කරන ලද්දේ යයි උද්දේශිත යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් මධ්‍යස්ථානයේ යම් නිලධාරියෙකුට, සේවකයෙකුට හෝ නියෝජිතයෙකුට විරුද්ධවද, අධිකරණය ඉදිරියේ නඩු නොපැවරිය යුතු ය.

22. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ ප්‍රඥප්තියේ අර්ථ නිරූපණය

''අමාත්‍යවරයා'' යන්නෙන් බස්නාහිර පළාතේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා ද,

''අමාත්‍ය මණ්ඩලය'' යන්නෙන් බස්නාහිර පළාතේ අමාත්‍ය මණ්ඩලය ද,

''පළාත් සභාව'' යන්නෙන් බස්නාහිර පළාතේ පළාත් සභාව ද,

''මධ්‍යස්ථානයේ ආරම්භක අවස්ථාව'' යන්නෙන් මෙම ප්‍රඥප්තිය යටතේ මධ්‍යස්ථානය ක්‍රියාත්මක වීම ආරම්භ වී මධ්‍යස්ථානය ස්වාධීනව ක්‍රියාත්මක වීමට උචිත අවස්ථාවකට පත්ව ඇති බවට බස්නාහිර පළාතේ අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කරනු ලැබීමෙන් පසු එම අමාත්‍ය මණ්ඩල තීරණයට බස්නාහිර පළාතේ ආණ්ඩුකාරවරයා අනුමැතිය ලබා දෙන දිනය දක්වා කාලය අදහස් වේ.

23. මෙම ප්‍රඥප්තියේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර, අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය. අනනුකූලතාවයක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු බව.

0 3 - 135

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.